HDTS

සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය (බෝට් හවුස්)

සාමාජිකත්වයේ දූ පුතුන්ගේ සැඟවුණු කුසලතාවයන් ඔප් නංවමින්,

දිරියදරු සිත්තම් 2026

සාමාජික දූ පුතුන්ගේ සැඟවුණු නිර්මාණ කුසලතාවයන්, කලා හැකියාවන් හා සෞන්දර්යාත්මක සිතුවිලි ඇගයීමට ලක්කිරීම හා

2027 නව වසර සඳහා අප සමිතිය මගින් මුද්‍රණය කිරීමට බලාපොරොත්තු වන දින දර්ශනය සාමාජිකත්වයේ දූවා දරුවන්ගේ චිත්‍ර නිර්මාණයන්ගෙන් අලංකාර කිරීමට බලාපොරොත්තු වෙමු.

✍ චිත්‍ර තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන තරඟයේ විස්තර :-

☺ වයස් කාණ්ඩය (Age Group) සඳහා නියමිත මාතෘකාව

අවුරුදු 4 - 8 කාණ්ඩය

1) අපේ ගෙදර මගේ යාළුවෝ ඇවිත්
2) මගේ සරුංගලේ අහසට ගිහින්
3) අත් සෝදා කෑම කමු
4) උදේට මගේ ගෙවත්තේ අසිරිය

අවුරුදු 9 - 11 කාණ්ඩය

1) ගමේ අවුරුදු උත්සවය
2) අනාගත මගේ සිහින රැකියාව
3) නෑගම් යන අපේ ගෙදර අය
4) පරිසරය පිරිසිදු නම් අපිත් නිරෝගියි

අවුරුදු 12 - 15 කාණ්ඩය

1) අනාගත ශ්‍රී ලංකාවේ දියුණු නගරයක්
2) වැසිදාක මුහුදු වෙරළ
3) පාසලේ ශ්‍රමදානය දා අපි
4) නීරෝගී තරුණ පරපුරක් සඳහා පෝෂ්‍යදායී ආහාර ගමු

අවුරුදු 16 - 18 කාණ්ඩය

1) රට නැගුමට බලශක්තිය
2) රාත්‍රී වීදි සරණ පෙරහැරක දර්ශනයක්
3) අධ්‍යාපනය තුළින් ගොඩනගාගත් මගේ අනාගතය
4) සෞඛ්‍ය සම්පන්න අනාගතයකට මත්ද්‍රව්‍ය එපා

☺ චිත්‍රයේ ප්‍රමාණය - A3 (දිග 16.5" x පළල 11.7")

☺ සිතුවම් ආර (Printing Style) - නිදහස් ආර (Free Style) (දියසායම් / පැස්ටල් / පාට පැන්සල්)

තරඟාවලියේ නීති රීති සහ කොන්දේසි

01. අයදුම්කරුවන් විසින් මෙහි සඳහන් පරිදි සකසා ගත් අයදුම්පතක් නිසි පරිදි සම්පූර්ණ කර චිත්‍රය පිටුපස අලවා ඉදිරිපත් කල යුතුය.

02. **චිත්‍ර භාරගන්නා අවසාන දිනය :- 2026 ඔක්තෝම්බර් මස 30**

03. මීට ඉහතදී පැවැත් වූ දිරියදරු සිත්තම් තරඟාවලි තුලදී පළමු, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් දූවා දරුවන්ට මෙවර දිරියදරු සිත්තම් - 2026 තරඟාවලිය සඳහා එම වයස් කාණ්ඩය යටතේම ඉදිරිපත් විය නොහැකි බව කාරුණිකව දන්වා සිටිමු.

04. ඔබට අයත් වයස් කාණ්ඩයට අදාළ මාතෘකාවකට එක් චිත්‍රයක් පමණක් එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කල හැකිය.

05. සෑම වයස් කාණ්ඩයකින්ම නිර්මාණ තුන බැගින් තෝරා ගැනේ.

06. මෙම චිත්‍ර අතරින් ජයග්‍රාහි චිත්‍ර 2027 දින දර්ශනයට ඇතුළත් කරන බැවින් භාවිතා කරන කඩදාසි තිරස් ආකාරයට (Landscape) නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

07. දුවගේ හෝ පුතාගේ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් විදුහල්පතිතුමා/ තුමිය, ආයතන ප්‍රධානී මගින් සහතික කර මේ සමග ඉදිරිපත් කරන්න.

08. සියලු නිර්මාණ 37/36, පන්සල පාර, කොළඹ 10 යන ලිපිනයට තැපැල් මගින් හෝ ගෙනැවිත් භාරදිය හැකිය.
චිත්‍රය බහා එවන කවරයේ වම්පස " දිරියදරු සිත්තම් 2026 " යනුවෙන් සඳහන් කර එවන්න.

09. විනිශ්වය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

තරඟයේ එක් එක් කාණ්ඩ වල ජයග්‍රහණ සඳහා හිමි ත්‍යාගයන්

	ස්ථානය	ත්‍යාගය
වයස් කාණ්ඩ 4 සඳහාම	පළමු ස්ථානය	සහතිකය/ තිළිණය සමග රු. 35,000/-
	දෙවන ස්ථානය	සහතිකය/ තිළිණය සමග රු. 25,000/-
	තෙවන ස්ථානය	සහතිකය/ තිළිණය සමග රු. 20,000/-
	4 සිට 10 දක්වා ස්ථාන	සහතිකය/ තිළිණය සමග රු. 15,000/-

දිරියදරු සිත්තම් චිත්‍ර තරඟය - 2026
අයදුම් පත්‍රය

ශිෂ්‍යාගේ/ ශිෂ්‍යාවගේ නම : ....

පාසල : ....

උපන් දිනය : ....

ලිපිනය : ....

චිත්‍රයේ තේමාව : ....

වයස් කාණ්ඩය : ....

සාමාජික මහතා/ මහත්මියගේ නම : ....

සේවා ස්ථානය : ....

වැටුප් අංකය : ....

සාමාජික අංකය : ....

දුරකථන අංකය : .... (ජංගම) .... (නිවස)

මෙම චිත්‍රය මා විසින් අඳින ලද්දක් බව සහතික කරමි.

....

නම හෝ අත්සන දිනය

මෙම චිත්‍රය ඉහත නම සඳහන් ශිෂ්‍යා/ ශිෂ්‍යාව විසින් අඳින ලද්දක් බව සහතික කරමි.

පෙර පාසල්/පාසල් ගුරුතුමා/තුමියගේ, ආයතන ප්‍රධානීගේ
නම : ....

....

අත්සන දිනය

පෙර පාසල් / පාසල් විදුහල්පතිතුමා / තුමියගේ, ආයතන ප්‍රධානීගේ අත්සන, නිල මුද්‍රාව සමග :

එච්.එම්. රෝහිත කුමාර
ගරු සභාපති

ටී. ප්‍රියංකා කුමුදිනී
ගරු ලේකම්

වයි. සරත් සිසිර කුමාර
ගරු භාණ්ඩාගාරික

සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය (බෝට් හවුස්)
37/36, පන්සල පාර, කොළඹ 10
ටෙලි/ෆැක්ස්: 011-2685016, 011-2662870, 011-2676088, 011-2676099
E-mail: sechdts@gmail.com